රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2013

මගේ අංකය: HAF-2/15/**CORDI**/15/1537

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07

2013.11.11

අමාත්‍යාංශ ලේකම්වරුන්

ප්‍රධාන ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ප්‍රාදේශීය ලේකම්වරුන් කොළඹට කැඳවීම සීමා කිරීම</u>**

ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූල වන පරිදි රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය සේවා සැපයුම හා සංවර්ධන කටයුතු ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන කාර්යභාරය ප්‍රාදේශීය ලේකම්වරුන් සතු වේ. මෙම කාර්යයන් ක්‍රමවත්ව අධීක්ෂණය කර කාර්යක්ෂම අයුරින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් ඔවුන්ගේ පරිපාලන කොට්ඨාශය තුල නිරතුරුව රැඳී සිටීම අත්‍යාවශ්‍ය කරුණකි.

02) එසේමුත් විවිධ අමාත්‍යාංශ විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වරින් වර කොළඹටකැඳවීමට කටයුතු කරන බැවින් ඔවුන්ගේ හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රාජකාරී කටයුතු වලට බාධා ඇති වේ. එමෙන්ම ඇතැම් අවස්ථාවලදී මෙම කැඳවීම් කෙටි කාලයකින් දැනුම් දීම හේතුවෙන් ඔවුන් කලින් යොදාගත් කාර්යාලයීය රැස්වීම්, ක්ෂේත්‍ර පරීක්ෂාවන් හදිසියේ අවලංගු කර රැස්වීම් වලට සහභාගී වීමට සිදුවීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් මෙන්ම මහජනතාවද දැඩි අපහසුතාවයට පත්වන බවට මෙම අමාත්‍යාංශයට වාර්තා වී ඇත.

03) මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන 2013 ජූලි මස 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන් කොළඹට කැඳවීම සීමා කල යුතු බව තීරණය කර ඇත.

04) ඒ අනුව ඉතාමත් අත්‍යාවශ්‍ය කරුණුවලට අදාළව පවත්වනු ලබන සම්මන්ත්‍රණ හා රැස්වීම් සඳහා පමණක් ප්‍රාදේශීය ලේකම්වරුන් කොළඹට කැඳවිය යුතුය. එසේම මෙම කැඳවීම් සඳහා වූ ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කල යුතු අතර එසේ ලැබෙන ඉල්ලීම් අනුවඅවශ්‍යතාවය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට හෝ වෙනත් සුදුසු ස්ථානයකට ඔවුන් කැඳවා හෝ දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම ( Video Conference ) මගින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දිය හැකි වේ.

05) ඉහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන මෙන්ද, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / සංස්ථා / ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසද දන්වා සිටිමි.

**පී.බී.අබේකෝන්**

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය